සැ. යු. - 2020.06.04 වැනි දින පළ වූ අංක 2179 දරන ගැසට් පත්‍රයේ II, III සහ IV (අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,180- 2020 ජුනි මස 12 වැනි සිකුරාදා - 2020.06.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 706 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 710 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජූලි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජුනි මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මඩකලපුව දිස්ත්‍රික්කය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - *2020 ජූලි - 2021 ජූනි*

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයට අනුව මඩකලපුව දිස්ත්‍රික්කයේ මණ්මුනයි පත්තු, ආරයම්පති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රා තැබෑරුම් සඳහා 2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජූනි මස 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවත්වන ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රුපියල් එක්දහස් පන්සියයක (රු. 1,500) මුදලක් මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් නමින් ගෙවා ලබාගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් ඉල්ලුම්පත ලබාගත හැකිය. ටෙන්ඩර්පත සමග රිසිට්පත අමුණා තිබිය යුතු ය. ටෙන්ඩර්පත් නිකුත්කරනු ලබන්නේ 2020.06.15 වැනි දින සිට 2020.06.25 දින පස්වරු 3.00 දක්වා.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර්පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15% කට අඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර්පත්‍ර සමග ඇමිණිය යුතුයි.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් ඉදිරිපත් නොකරන ටෙන්ඩර්පත් සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍යනම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ දින සිට සති දෙකක් තුළ ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේනම් එම ඉල්ලීම සළකා බලනු ලැබේ.

05. තැබෑරුම දැනට පවත්වන ස්ථානයේ ඉදිරි කාලයේත් අඛණ්ඩව තිබේදැයි සහතික නොමැති තැබෑරුම්.

06. ලියාපදිංචි කළ පොල් හා තල් සමූපකාර සමිති මෙම රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සමිතිය පිහිටුවා ඇති ප්‍රදේශයට අයත් රා තැබෑරුම සඳහා පමණක් ඉල්ලුම්පත ඉදිරිපත් කළ හැකි අතර දැනට සමිතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව ද හා රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ද මඩකලපුව දිස්ත්‍රික් සහකාර සමූපකාර සංවර්ධන කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 හා 2012.01.05 දින දරන චක්‍රලේඛය අනුව තිබිය යුතු ය)

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මණ්මුනයි පත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

න.සදායානන්ති,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මණ්මුනයි පත්තු,
මඩකලපුව.

2020 මැයි මස 29 වැනි දින,

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය**

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* | |
|---|---|---|---|
| | | *දිනය* | *වේලාව* |
| මණ්මුනයි පත්තු | ආරයම්පති - දකුණ ග්‍රාම නිලධාරි වසම | 2020.06.26 | පෙ. ව. 9.30 |

***සටහන*** .- 1. ටෙන්ඩර් මණ්ඩලය 2020.06.26 වැනි දින පෙ. ව. 10.30 ට රැස්වේ.

2. විකුණුම් දින සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2020.07.03 වැනි දින පෙ. ව. 10.30 ට පැවැත්වේ.

06 - 71

## මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2020/2021 වර්ෂය සඳහා මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම

2020.07.01 දින සිට 2021.06.30 දක්වා

01. 2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජූනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසිය හා සෑම සුරාබදු බලපත්‍රයක් ම සඳහා අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණය යටත් පිරිසෙන් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතුයි.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ "අංක 13 දරන පම්බල රා තැබෑරුම" සඳහා ටෙන්ඩර් පත්‍රය යනුවෙන් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් පරිදි රා තැබෑරුමෙහි නම සහ අංකය සඳහන් කොට 2020.06.26 වැනි දින පෙ. ව. 10.30 ට පෙර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුයි.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු යි.

05. 2020.06.26 වැනි දින පෙ. ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු යි.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

ජ්. එම්. සී. එම්. ප්‍රේමසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
මාදම්පේ.

2020 මැයි මස 29 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
මාදම්පේ.

*උපලේඛනය*

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *තැබෑරුම් අංකය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රු.)* |
|---|---|---|---|---|---|---|
| උතුරු පිටිගල් කෝරළය | පම්බල | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | 13 | 2020.06.26<br>පෙ. ව. 10.30 | 1,000.00 |

06-107

## කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය

රා තැබැරුම් රේන්ද විකිණීම 2020/2021 වර්ෂය - 2020 ජූලි මස සිට 2021 ජුනි මස දක්වා

2020 ජූලි මස 01 වැනි දින සිට 2021 ජුනි මස 30 වැනි දින දක්වා වූ මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දිනැති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් රා තැබැරුම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයකට සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතුය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි අංක ................................ දරන ................................ රා තැබැරුම සඳහා යනුවෙන් හා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබැරුමේ නම සහ අංකය සඳහන් කොට 2020.06.19 වැනි දින පෙ.ව. 10.30 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතුය.

05. 2020.06.19 වැනි දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

032 - 4934202, 032 - 4934205)

එම්. එම්. එන්. සෝමතිලක,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2020 මැයි මස 29 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
කල්පිටිය.

### *උපලේඛනය*

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබැරුම* | *ටෙන්ඩර් පත්‍රය භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|
| 01 | කල්පිටිය | දළුව | රා | 2020.06.19 වැනි දින පෙ.ව. 10.30 | 1,000.00 |
| 02 | කල්පිටිය | ඒත්තාලේ | රා | 2020.06.19 වැනි දින පෙ.ව. 10.30 | 1,000.00 |

06-127

## ඒරාවූර් පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාහරේ රා තැබෑරුම් රේන්ද විකිණීම - මඩකලපුව දිස්ත්‍රික්කය

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2020 ජූලි මස 01 සිට 2021 ජුනි මස 30 දක්වා

අංක 207 දරන 1982.08.20 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රකාශ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාහරේ රා තැබෑරුම් සඳහා 2020 ජූලි මස 01 දින සිට 2021 ජුනි මස 30 දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා කෝරළේපත්තුව උතුර වාහරේ ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2020.06.12 දින සිට 2020.06.18 වැනි දින ප. ව. 3.00 දක්වා වේ.

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15%කට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් සමග අමුණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබාගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කළ දින සිට සති දෙක ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලවලටත් තිබේදැයි සහතික නැත.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම රේන්ද විකිණීමේ දී සහභාගිවන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට අදාළ රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඒ සමග සංගම දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමූපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛනයට අනුව)

07. අනිකුත් තොරතුරු කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

එස්. ගරන්,
ප්‍රාදේශීය ලේකම්,
කෝරළේපත්තුව උතුර, වාහරේ.

2020 ජුනි මස 08 වැනි දින.

### රා තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* |
|---|---|---|
| පාල්චේනයි ග්‍රාම නිලධාරි වසම | TT No. 5 | 2020.06.19 ප. ව. 2.30ට |

සටහන .- 1. ටෙන්ඩර් කමිටුව 2020.06.19 දින ප. ව. 2.30 ට රැස්වේ.

2. විකිණීමේ දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීමේ ටෙන්ඩර් කමිටුව 2020.06.26 වැනි දින ප.ව. 2.30 ට පැවැත්වේ.

06-148

# රජයේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

කුරුණෑගල, මාස්පොත, රත්කරව්ව දරන ස්ථානයේ පදිංචි තේවරාජ් සරත්චන්ද්‍ර ජයලත් වන මා විසින් ලියා අත්සන් කරන ලද, හා කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් මංජුලා කේ. ලියනගේ මිය විසින් 2019 පෙබරවාරි මස 08 වැනි දින ලියා සහතික කළ අංක 59 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් අලව්ව, වැරැල්ලගම ලිපිනයේ පදිංචි හලප්පෙරුම ආරච්චිගේ සුසිල් ලක්ෂ්මන් ෆොන්සේකා (ජා. හැ. අංක 612691959 V) වෙත පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කොට එම ඇටෝර්නි බලපත්‍රය බල රහිත කරන බවත්, මින් ඉදිරියට වර්ෂ 2020ක් වූ මැයි මස 22 වැනි දින සිට ඔහු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ගනුදෙනුවකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

තේවරාජ් සරත්චන්ද්‍ර ජයලත්.

06-27

---

### ඇටෝර්නි බලය අවලංගු කිරීම

එක්සත් රාජධානියේ (No. 132, Foxeley Lane, Purely Surrey CR8 3 NE, United Kingdom යන ලිපිනයේ) පදිංචි වෛද්‍ය නන්දින් දයා පන්ඩිත ගුණවර්ධන හා වෛද්‍ය විජිතා රන්ජනිකාන්ති පන්ඩිත ගුණවර්ධන යන අප දෙදෙනාම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සියලු මහජනතාවටත් මෙයින් දන්වා සිටින්නේ ප්‍රසිද්ධ නොතාරිස් ටී. පී. ඩී. එස්. ගුණසේකර විසින් ලියා සහතික කළ අංක 483, 2019.06.12 දින දරන සහ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 2019.07.22 දිනැතිව දිනපොත් අංකය 11760 වෙලුම/පත්‍රිරුව 99/280 යටතේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය මගින් අපගේ ඇටෝර්නි බලකරු ලෙස කොළඹ 05, ලෙයාර්ඩ්ස් පාර, අංක 39 දරන ලිපිනයේ පදිංචි රුවන්මලී සේපාලිකා ජයසිංහ විවාහයට පෙර මෙන්ඩිස් (ජා. හැ. අංක 688520193 V) යන අයට ලබාදුන් ඇටෝර්නි බලය මෙතැන් සිට අවලංගු, ශූන්‍ය බලරහිත හා ප්‍රත්‍යාදිෂ්ඨ වන බවයි.

එසේ ම ඉහත සඳහන් රුවන්මලී සේපාලිකා ජයසිංහ විවාහයට පෙර මෙන්ඩිස් යන අය මින් ඉදිරියට ඉහත ඇටෝර්නි බලපත්‍රය යටතේ කිනම් අයුරකින් හෝ සිදුකරන කිසිදු කටයුත්තකට අප වග නොකියන බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට හා පොදු මහජනතාවට මෙයින් දැනුම් දෙමු.

වෛද්‍ය නන්දින් දයා පන්ඩිත ගුණවර්ධන,
වෛද්‍ය විජිතා රන්ජනිකාන්ති පන්ඩිත ගුණවර්ධන.

06-40

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි.

සමාගමේ නම : ඉලෙවන් ෆ්‍රෙයිට් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 00221344
සමාගම සංස්ථාපනය කළ දිනය : 2020.03.14
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : ඊ 166, ඉසුරුපුර, මාලඹේ
සමාගම් ලේකම් - නීතිඥ කේ. ඒ. එම්. එච්. කොඩිතුවක්කු

06-78

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හොරණ, ඉළිඹ, පොල්වත්ත, දෙවන මාවත, අංක 220 ඒ යන ලිපිනයේ පදිංචි කන්නන්ගර ආරච්චිගේ සරෝජා වන මම නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩී. එම්. ටී. විජේසිංහ මහතා විසින් ලියා සහතික කළ අංක 874 දරන ඇටර්නි බලපත්‍රය මගින් බදුරලිය, කඹුරාවල යන ලිපිනයේ පදිංචි ගල්හේනකන්දගේ දොන් තුසිත නයන කුමාර යන අයට පවරා තිබූ ඇටෝර්නි බලය වර්ෂ 2019.12.27 වැනි දින සිට අවලංගු කරන ලද බව සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වා සිටිමි. එකී ඇටෝර්නි බලපත්‍රය මත මින් ඉදිරියට මා වෙනුවෙන් ඔහු විසින් කරන ලද කිසිදු කටයුත්තකට වග නොකියන බව ප්‍රකාශ කරමි.

කන්නන්ගර ආරච්චිගේ සරෝජා.

06-98

---

## බිමා ලංකා ඉන්ෂුවරන්ස් බ්‍රෝකර්ස් (පුද්ගලික) සමාගම

පී. වී. 00207162

**2007 අංක 7 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීමයි**

මෙම දැන්වීම පළ වී දින හැටකට නොඅඩු කාලයක් තුළ පවත්වන්නට යෙදෙන අති විශේෂ මහා සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනා සම්මුතිය අනුමත කර ගැනීමට යෝජනා වී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**විශේෂ යෝජනා සම්මුතිය**

2007 අංක 07 දරන සමාගම් පනතේ 59 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය රුපියල් හාරකෝටි අනූඑක් ලක්ෂයක (රු. 49,100,000) වටිනා හාර කෝටි නම ලක්ෂ දස දහසක (4,910,000) සාමාන්‍ය කොටස්, රුපියල් විසිහත් කෝටි පන්ලක්ෂ අසූපන් දහසක (රු. 27,585,000) වටිනා විසිහත් ලක්ෂ පනස් අට දහස් පන්සියයක් (2,758,500) සාමාන්‍ය කොටස් දක්වා අඩු කිරීමට යෝජනා මෙයින් සම්මත කරනු ලැබේ.

මණ්ඩලයේ අණ පරිදි,

බී. ඩී. ඕ. සෙක්‍රටරීස් (පීවීටී) ලිමිටඞ්,
සමාගම් ලේකම්වරු.

06-156

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.